# ආර්ථික වර්ධනය සඳහා ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහයේ නැඹුරුවීම්

එස්. ඩබ්. ජී. කේ. බුලංකුලම

## 1. හැඳින්වීම

නිදහස ලබා ගැනීමට පෙර සහ ඉන්පසුවත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන නිෂ්පාදන අංශය ලෙස ගොඩ නැගෙමින් පැවතියේ කෘෂිකාර්මික අංශයයි. එකල වී නිෂ්පාදනය මත පදනම් වූ දේශීය කෘෂිකර්මාන්තය තේ, රබර්, පොල් මත පදනම් වූ වාණිජ බෝග වගාවක් දක්වා 1815 න් පසු කාල පරිච්ඡේදය තුළ දී පරිවර්තනය විය. කෘෂි අපනයන බෝගයන්ගේ දායකත්වය 1977 දක්වාම කැපීපෙනෙන ලෙස වර්ධනය විය. මෙකී නිෂ්පාදන අංශයන් විශේෂීකරණය වීමේ දී ඒවාහි සාපේක්ෂ දායකත්වය ආර්ථික වර්ධනය සඳහා ප්‍රමාණවත්ද? යන්න අධ්‍යයනය කිරීම කාලෝචිත වේ. ඒ අනුව ශ්‍රී ලංකා ආර්ථිකයේ ව්‍යුහයේ එනම් කෘෂි හා කර්මික අංශයන්ගේ ස්වභාවය අධ්‍යයනය කිරීමටත්, ජාත්‍යන්තර ආර්ථිකය තුළ ආර්ථික වර්ධනයක් ලගා කරගෙන ඇති සිංගප්පූරුව, තායිවානය, මලයාසියාව වැනි දූපත් ආර්ථිකයන්ගේ ව්‍යුහත්මක ස්වභාවය අධ්‍යයනය කරීමටත් මූලික ලෙස අරමුණු විය. මේ සඳහා මූලික ලෙස යොදා ගනු ලැබුවේ ද්විතික දත්තයන් වේ. අනතුරුව එම දත්තයන් ජ්‍යාමිතික සහ විස්තරාත්මක යන විශ්ලේෂණතා ක්‍රමවේදයන් දෙක භාවිතයෙන් විශ්ලේෂණය කර ඇත.

## 2. දළ දේශීය නිෂ්පාදිතයට කෘෂි හා කාර්මික අංශයන්ගේ දායකත්වය

වර්ෂ 1950 වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් 45% කට පමණ කෘෂි අංශයේ දායකත්වය ලැබී ඇත. වර්ෂ 1970 1972 කාල පරිච්ඡේ තුළ ආවෘත ආර්ථිකයක් ක්‍රියාත්මක විය. මෙම කාල පරිච්ඡේදය, ආර්ථිකය දරුණු ලෙස පසුබැසීමකට ලක් වූ යුගයක් විය. සාමාන්‍ය වාර්ෂික වර්ධනය 2.8 %ක් තරම් අඩු මට්ටමක පැවතිණි. මෙලෙස ගෙවී ගිය කාල පරිච්ඡේදයෙන් පසු එළඹි 1977 වර්ෂයේ දී විවෘත ආර්ථිකයට මුල පිරිණි (ශ්‍රී ලංකා මහ බැංකුව, 1998:137). ඒ තුළ සියළු වෙළඳ සීමා ඉවත් විය. වෙළඳපොළ ඉල්ලුම හා සැපයුම අනුව මිල තීරණය වන තත්ත්වයක් නිර්මාණය විය. ඒ තුළින් නිෂ්පාදකයන් අතර තරඟකාරිත්වයක් ගොඩ නැගිණි. පෞද්ගලීකරණය තුළින් බලාපොරොත්තු වන්නේ මෙලෙස පුළුල් තරඟකාරිත්වයක් ඇති කිරීමයි. රක්ෂණ සමාගම්, බැංකු හා ගමනාගමන යන අංශවල පැවති රාජ්‍ය ඒකාධිකාරය අහෝසි කර පුද්ගලික අංශයට බාර කළහ. ඒ අනුව පෞද්ගලික අංශයේ මැදිහත්වීම සහිත අපනයන පෙරදැරි කරගත් කර්මාන්තවලට ප්‍රමුඛස්ථානය ලබා දෙන කාර්මික ප්‍රතිපත්ති ප්‍රකාශනයක් 1995 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කරන ලදි (ශ්‍රී ලංකා මහ බැංකුව, 1998:137).

ශ්‍රී ලංකාව, නිදහස් වෙළඳ ප්‍රතිපත්තිවලට අනුකූල වීම නිසා ආනයන සීමා ඛ්‍යීම මඟින් කෘෂි අංශය සඳහා රැකවරණය සැලසීමට අපොහොසත් වී ඇත. තවද ශ්‍රී ලංකාව දකුණු ආසියානු සහයෝගිතා සංවිධානයේ (SAFTA) මෙන්ම වෙනත් කලාපීය ජාත්‍යන්තර ගිවිසුම්වල කොටස්කරුවකු වීම නිසා ආයාත කරන කෘෂිකාර්මික භාණ්ඩ සමඟ දේශීය කෘෂි භාණ්ඩවලට තරඟ කිරීමට නොහැකි තත්ත්වයක් විය. මෙනිසා කෘෂි අංශයේ නිෂ්පාදනවලට වඩා වැඩි වේගයෙන් කාර්මික හා සේවා අංශයන්ගේ දායකත්වය ඉහළ ගියහ.

*වගු අංකය 01*

| අංශය | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|---|---|---|
| කෘෂි අංශයෙන් වර්ධන වේගයට කරන දායකය | 0.000 (1%) | 0.002 (4%) | 0.008 (10%) | 0.004 (6%) | 0.009 (15%) | 0.004 (11%) | 0.008 (10%) |
| කර්මාන්ත අංශයෙන් වර්ධන වේගයට කරන දායකය | 0.015 (28%) | 0.022 (35%) | 0.023 (30%) | 0.021 (32%) | 0.017 (28%) | 0.012 (34%) | 0.024 (30%) |
| සේවා අංශයෙන් වර්ධන වේගයට කරන දායකය | 0.039 (72%) | 0.038 (61%) | 0.046 (60%) | 0.042 (62%) | 0.034 (57%) | 0.020 (55%) | 0.048 (59%) |
| වර්ධන වේගය | 0.054 | 0.062 | 0.077 | 0.068 | 0.060 | 0.035 | 0.080 |

*මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තා, 20002010.*

1950 වර්ෂයේ දී දළ දේශීය නිෂ්පාදිතයෙන් 38 % ක් වූ කෘෂි අංශයේ දායකත්වය 2009 වර්ෂය වන විට එය 12 % ක් දක්වා අඩු වී ඇති අතර කාර්මික හා සේවා අංශයන්ගේ දායකත්වය පිළිවලින් 29% ක් හා 59% ක් දක්වා ඉහළ ගොස් ඇත (ශ්‍රී ලංකා මහ බැංකුව, 2009ඃ32). කෘෂිකාර්මික අංශයේ ඉහළ දායකත්වයක් පෙන්නුම් කිරීම සංවර්ධනය වන රටවල දැකිය හැකි ලක්ෂණයක් විය. නමුත් සංවර්ධනයේ ඉහළ අගයකට ලඟා වීමේ දී කෘෂි අංශයේ සාපේක්ෂ වැදගත්කම ක්‍රමයෙන් අඩු වන ආකාරයේ ව්‍යුහාත්මක වෙනසක් සිදු විය යුතු බව සිංගප්පූරුව, මලයාසියාව, තායිවානය වැනි නව කාර්මික රටවල ආර්ථික ව්‍යුහයන් අධ්‍යනය කිරීමෙන් අවබෝධ වේ.

*රූප සටහන 01*




*මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව (20042010), වාර්ෂික වාර්තා ආශ්‍රයෙන් කර්තෘ විසින් නිර්මාණය කරන ලදි.*

2005 වර්ෂයේදී කෘෂි අංශයේ වර්ධන වේගයට 4% ක දාකත්වයක් සැපයූ අතර එය 2010 වර්ෂය වන විට 10% දක්වා ඉහළ ගොස් ඇත. නමුත් කර්මික අංශයේ වර්ධන වේගය 2005 වර්ෂයේ දී 35% ක් ලෙස වාර්තා කළ අතර සේවා අංශයේ වර්ධන වේගය 61% ක් ලෙස වර්ධනය

විය. 2005 වර්ෂයේ සිට ගෙවුන අවුරුදු 5 ක කාල පරිච්ඡේදය තුළ 2010 වර්ෂය වන විට කාර්මික සහ සේවා අංශයන්ගේ වර්ධන වේගය පහළ ගොස් ඇති අතර කෘෂි අංශයේ වර්ධන වේගයේ ඉහළ යාමක් දැකි ගත හැකි වේ.

දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික, කාර්මික සහ සේවා අංශයන්ගෙන් 2004, 2005, 2006, 2007, 2008, 2009 යන වර්ෂයන්ගේ වැඩිම දායකත්වය ලබා දී ඇත්තේ සේවා අංශයෙනි. එනම් 2004, 2005 වර්ෂයන් හි දී එය 55% ක මට්ටමක පැවති අතර 2008, 2009 වර්ෂයන් හි දී 59% ක මට්ටමක පැවතිනි. මේ තුළ වැඩිම දායකත්වය සපයන අංශය වන්නේ තොග සහ සිල්ලර වෙළදාම වන අතර දේශීය සහ ආනයන වෙළදාම වැඩි දායකත්වයක් සපයයි. එමෙන්ම බැංකු රක්‍ෂණ සහ දේපල වෙළදාම් යන අංශයද දළ දේශීය නිෂ්පාදනය සඳහා 9% ක දායකත්වයක් සපයයි.

*වගු අංක 02*

කෘෂි, කාර්මික සහ සේවා අංශයන් දළ දේශීය නිෂ්පාදිතයට කරන දායකත්වය

| අංශය | 2004 | 2005 | 2008 | 2009 |
|---|---|---|---|---|
| 1. කෘෂිකාර්මික | 17.9 | 17.2 | 12.1 | 12.0 |
| 2. කාර්මික · | 26.4 | 27.0 | 28.4 | 28.6 |
| 3. සේවා | 55.6 | 55.8 | 59.5 | 59.3 |
| 3.1 තොග සහ සිල්ලර වෙළදාම | 22.3 | 21.6 | 24.2 | 23.3 |
| ආනයන වෙළදාම | 10 | 9.8 | 9 | 8.1 |
| අපනයන වෙළදාම | 2.5 | 2.5 | 4. | 4.1 |
| දේශිය වෙළදාම | 9.0 | 8.8 | 10.8 | 11.1 |
| 3.2 හෝටල් සහ ආපනශාලා | 0.7 | 0.5 | 0.4 | 0.4 |
| 3.3 ප්‍රවාහන සහ සන්නිවේදන | 14.6 | 15.5 | 13.1 | 13.5 |
| 3.4 බැංකු රක්‍ෂණ සහ දේපල වෙළදාම් | 11.7 | 11.7 | 8.7 | 8.9 |
| 3.5 රාජ්‍ය පරිපාලනය සහ අනෙකුත් සේවා | 7.1 | 7.0 | 7.7 | 7.8 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තාව, 2005, 2009*

වර්ෂ 2000 සිට කෘෂිකාර්මික, කාර්මික සහ සේවා යන අංශයන් දළ දේශීය නිෂ්පාදිත වර්ධන අනුපාතිකයන්ට දායක වී ඇති ආකාරය සලකා බැලීමේ දී වර්ෂ 2000 දී අංශයන් තුනෙහිම ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර වර්ෂ 2001 දී පෙන්නුම් කර ඇත්තේ ඍණ වර්ධනයකි. නමුත් වර්ෂ 2002 දී සිට සේවා අංශයේ දායකත්වය සීඝ්‍ර ලෙස පහත හෙළමින් කාර්මික අංශය වර්ධනය වී ඇත. 2009 වර්ෂය වන විට සේවා අංශයේ වර්ධන අනුපාතය 0.3 ක් විය. මේ සඳහා දේශීය වෙළදපොළ අභිමුඛ කර්මාන්ත, ගෝලීය ආර්ථිකය යථාතත්ත්වයට පත්කිරීම සහ අපනයනාභිමුඛ කර්මාන්තවල මනා ක්‍රියාකාරීත්වයද හේතු විය.

1. ප්‍රස්තාර සටහන




*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තා, 20002009.*

## 3. ජාත්‍යන්තර වෙළඳාම කෙරෙහි කෘෂි හා කාර්මික අංශයන්ගේ දායකත්වය

ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රධාන වශයෙන් සංකේන්ද්‍රව පැවතියේ තේ, රබර්, පොල් යන වාණිජ බෝග වටාය. එනම් තේ, රබර් හා පොල් යන වැවිලි බෝග, අපනයන අංශය සඳහා ඉහළ දායකතවයක් සැපයීය. අපනයන ආදායම තුළ වැඩිම දායකත්වයක් සැපයූ නිෂ්පාදන අංශය වූයේ තේ අපනයනයි. එය සමස්ත අපනයන ආදායමින් 50% කට වඩා වැඩි විය (ශ්‍රී ලංකා මහ බැංකුව, 1955:13). මෙම වාණිජ බෝග හැරුණු විට ශ්‍රී ලංකාවේ ඇති වෙනත් දේශීය අපයනයන් පිළිබඳව සලකා බැලීමේ දී එය සමස්ත අපනයන ආදායමින් 5% ක් පමණ විය(ශ්‍රී ලංකා මහ බැංකුව, 1955:13). මේ තුළ වැඩි වශයෙන් අන්තර්ගත වූයේ මැණික් ඇතුළු ස්වාභාවික සම්පත් අපනයනයන්ය.

*වගු අංකය 03*

නිදහස ලැබූ මුල් කාල පරිච්ඡේදය තුළ අපනයන සංයුතිය

| **කාණ්ඩය** | **වටිනාකම (රුපියල් මිලියන)** | | | **සමස්ත අපනයනවල % ලෙස** | | |
|---|---|---|---|---|---|---|
| | 1953 | 1954 | 1955 | 1953 | 1954 | 1955 |
| තේ | 825 | 1123 | 1194 | 52.6 | 62 | 61.6 |
| රබර් | 338 | 285 | 350 | 21.5 | 15.8 | 18.0 |
| පොල් | 244 | 212 | 225 | 15.6 | 11.7 | 11.6 |
| වෙනත්දේශීය අපනයන | 83 | 99 | 103 | 5.3 | 5.5 | 5.3 |
| ප්‍රතිඅපනයන | 78 | 90 | 68 | 5.0 | 5.0 | 3.5 |
| සමස්ත අපනයන | 1568 | 1809 | 1940 | 100 | 100 | 100 |

*මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තාව, 1955.*

වර්ෂ 19651970 කාල පරිච්ඡේදයේ දී ආර්ථිකය අර්ධ වශයෙන් ලිහිල්කරණය වී තිබූ අතර 19601970 කාල පරිච්ඡේදය තුළ දී ආර්ථිකය අභ්‍යන්තරයට නැඹුරු වූ ප්‍රතිපත්තීන්ගෙන් සැකසී තිබුණි. මෙම දශක දෙකක කාලය තුළ සංවර්ධනයේ යන්ත්‍රණයක් ලෙස කටයුතු කිරීමට වෙළදාමට ඉඩ නොලැබිණි.

*වගු අංකය 04*

කෘෂිකාර්මික හා කාර්මික අපනයන % දායකත්වය
(ඇමරිකානු ඩොලර් මුළු අපනයන වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස)

| **වර්ෂය** | **කෘෂිකාර්මික අපනයන** | **කාර්මික අපනයන** |
|---|---|---|
| 1975 | 82 | 13 |
| 1976 | 77 | 15 |
| 1977 | 80 | 14 |
| 1979 | 71 | 24 |
| 1980 | 62 | 34 |
| 1982 | 55 | 39 |
| 1983 | 58 | 35 |
| 1985 | 54 | 40 |
| 1987 | 42 | 49 |
| 1989 | 39 | 51 |
| 1990 | 37 | 55 |
| 1991 | 32 | 62 |
| 1992 | 24 | 72 |
| 1994 | 21 | 74 |
| 1996 | 23 | 75 |
| 1997 | 22 | 76 |
| 1999 | 21 | 77 |
| 2001 | 22 | 76 |
| 2004 | 19 | 78 |
| 2006 | 19 | 79 |
| 2008 | 23 | 76 |
| 2009 | 24 | 75 |

මූලයඃ ශ්‍රී ලංකා මහ බංකුව, වාර්ෂික වාර්තා, 19752009.

වර්ෂ 1975  2009 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ දී ක්‍රමයෙන් දේශීය නිෂ්පාදනයට වඩා විදේශ වෙළඳාම කෙරෙහි වැඩි බලාපොරොත්තු තබා තිබුණු බව දක්නට ලැබේ (අපනයනාභිමුඛ සංවර්ධන ප්‍රතිපත්තිය). එනම්  වර්ෂ 1977 දී හඳුන්වා දුන් නිදහස් වෙළඳ ප්‍රතිපත්තියෙන් එය මනාව පිළිඹිඹු වේ. මෙම ප්‍රතිපත්තිය පදනම් වී ඇත්තේ ජාත්‍යන්තර වෙළඳාමෙන් වාසි ලැබේය යන මතය අනුවයි. මෙහි දී අපනයනාභිමුඛ සංවර්ධන ප්‍රතිපත්තිය, ප්‍රාථමික භාණ්ඩ හා කර්මික භාණ්ඩ අපනයනාභිමුඛ යනුවෙන් ප්‍රධාන කොටස් දෙකක් ඔස්සේ සාකච්ඡා කළ හැකිය (තන්තිරිගම,1992:213). විශේෂයෙන් 70 දශකයේ දී බ්‍රසීලය, චිලි, මැලේසියාව, තායිවානය වැනි දියුණු වන රටවල් කිහිපයක් මෙම ප්‍රතිපත්තිවලට නැඹුරුවීමක් දක්නට ලැබුණි. මෙම රටවල් වැඩි ගණනක් එක්දහස් නවසිය පනස් ගණන්වලදී කාර්මික නොවූ අඩු දියුණු රටවල්ය. වර්තමානය වන විට මෙම රටවලින් වැඩි ප්‍රමාණයක් ඉහළ කාර්මික වර්ධන අනුපාතයක් ඇති මධ්‍යම ආදායම් ලබන රටවල්ය. උදාහරණයක් ලෙස තායිවානයේ මුළු අපනයනය වාර්ෂිකව 20 % න් පමණ වැඩි වී ඇති අතර එම ඉපයුම්වලින් 75% ක් කාර්මික භාණ්ඩ වේ. සංවර්ධනය වන රටවල් සමස්තයක් ලෙස ගත් කල මුළු කාර්මික අපනයන භාණ්ඩවල සාපේක්ෂ වැදගත්කම 1950 වර්ෂයේ දී 26 % සිට 1980 වන විට 42 %දක්වා වැඩි වී ඇත (තන්තිරිගම,1992:213).

2 ප්‍රස්තාර සටහන




*මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව (19752005), වාර්ෂික වාර්තා ආශ්‍රයෙන් කර්තෘ විසින් නිර්මාණය කරන ලදි.*

ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන ඉපයීම්වලින් කෘෂිකාර්මික අංශය සඳහා වර්ෂ 1975 දී 82% ක දායකත්වයක් සපයා ඇති අතර කාර්මික අංශය සඳහා දායක වී ඇත්තේ 13% කිනි. වර්ෂ 1977 දී නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය හඳුන්වා දීමත් සමඟ සමස්ත අපනයන ඉපයීම් සඳහා කෘෂි අංශය මඟින් කල දායකත්වය ක්‍රමයෙන් අඩු වී ඇති අතර කාර්මික අංශය සඳහා කර ඇති දායකත්වය ක්‍රමයෙන් වැඩි වී ඇත. 1986 වර්ෂය වන විට සමස්ත අපනයන ඉපයීම් සඳහා කෘෂි හා කාර්මික අංශයන්ගෙන් කර ඇති දායකත්වය එකිනෙක සමාන වී ඇති බව 2 ප්‍රස්ථාර සටහනට අනුව පැහැදිලි වේ. එනම් 1984 වර්ෂයේ සිට 1991 වර්ෂය දක්වා ශ්‍රී ලංකා ආර්ථිකයේ සංක්‍රාන්ති කාල පරිච්ඡේදයක් පැවති බවට 2 ප්‍රස්ථාර සටහනට අනුව පැහැදිලි වේ.

එක්දහස් නවසිය පනහ දශකය තුළ ශ්‍රී ලංකා අපනයන ආර්ථිකය සඳහා වැඩිම දායකත්වයක් සැපවූයේ පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ගෙනි. නමුත් එක්දහස් නවසිය හැට දශකය වන විට එම තත්ත්වය වෙනස් වී සමස්ත අපනයන සඳහා ඉහළම දායකත්වයක් සපයන අංශය බවට තේ නිෂ්පාදනයන් පත්විය. එක්දහස් නවසිය හැත්තෑව දශකය තුළ දී ද තේ කර්මාන්තය මඟින් අපනයන සංයුතිය සඳහා ඉහළ දායකත්වයක් සැපයූ අතර 1977 දී ශ්‍රී ලංකාවේ විවෘත ආර්ථිකය බිහි වීමත් සමඟම කෘෂිකාර්මික අංශයෙන් කරන දායකත්වය ක්‍රමයෙන් ගිලිහී එය කාර්මික අංශය වෙත විතැන් විය. එනම් 1986 වර්ෂය වන විට කාර්මික අංශයේ දායකත්වය, වතු වැවිලි අංශයේ දායකත්වය අභිබවා ගියේය.

*වගු අංකය 05*

එක්දහස් නවසිය අසූව දශකය තුළ අපනයන සංයුතිය

| කාණ්ඩ | වි.ගැ.හි දශ ලක්ෂ | | |
|---|---|---|---|
| | **1986** | **1987** | **1988** |
| 1.කෘෂිකාර්මික අපනයන | 479 | 458 | 470 |
| තේ | 281 | 280 | 288 |
| රබර් | 80 | 77 | 87 |
| පොල් | 73 | 56 | 36 |
| 2.කාර්මික අපනයන | 483 | 525 | 530 |
| රෙදිපිළි හා ඇඟළුම් | 293 | 339 | 333 |
| ඛණිජ තෙල් නිෂ්පාදන | 72 | 68 | 53 |
| වෙනත් | 118 | 118 | 144 |
| 3.ඛණිජමය අපනයන | 36 | 47 | 61 |
| මැණික් | 23 | 38 | 48 |
| වෙනත් | 13 | 09 | 13 |

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තා, 19861988.

එක්දහස් නවසිය අසූව දශකය තුළ කෘෂිකාර්මික අපනයන හා කාර්මික අපනයන අතර වඩාත් කැපී පෙනෙන වෙනසක් දැකිය නොහැකි වූ අතර අපනයන සංයුතියේ දායකත්වයෙහි කැපී පෙනෙන ලෙස වෙනසක් සිදුවන්නට පටන් ගෙන ඇත්තේ එක් දහස් නවසිය අනූව දශකයේ සිටය. ඒ බව එක්දහස් නවසිය අනූව දශකය තුළ වූ අපනයන සංයුතිය පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වන අතර එහිදී 1992, 1993, 1994 සහ 1995 යන වර්ෂයන්ගේ දායකත්වය සලකා බලන ලදි. එනම් අනූව දශකය තුළ වන අන්ත වර්ෂයන්ගෙන් බැහැරව මධ්‍ය වර්ෂයන් ඔස්සේ අපනයන සංයුතියේ දායකත්වය පෙන්නුම් කරන ලදි.

*වගු අංකය 06*

එක් දහස් නවසිය අනූව දශකයේ අපනයන සංයුතිය

| **කාණ්ඩය** | **වි.ගැ.හි. දශලක්ෂ** | | | |
|---|---|---|---|---|
| | **1992** | **1993** | **1994** | **1995** |
| කෘෂිකාර්මික අපනයන | 429 | 469 | 490 | 546 |
| තේ | 241 | 295 | 296 | 317 |
| රබර් | 48 | 46 | 51 | 74 |
| පොල් | 60 | 41 | 53 | 68 |
| කාර්මික අපනයන | 1251 | 1502 | 1672 | 1885 |
| රෙදිපිළි හා ඇඟළුම් | 862 | 1009 | 1081 | 1219 |
| ඛණිජ තෙල් නිෂ්පාදන | 45 | 57 | 56 | 56 |
| වෙනත් | 345 | 437 | 535 | 611 |
| ඛණිජමය අපනයන | 45 | 54 | 60 | 57 |
| මැණික් | 40 | 50 | 55 | 51 |
| වෙනත් | 04 | 04 | 05 | 06 |

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තා, 19921995.*

වර්ෂ දෙදහසේ සහශ්‍රය තුළ අපනයන සංයුතිය තවදුරටත් පුළුල් වූ අතර ඒ තුළ කාර්මික අපනයන සඳහා කරන දායකත්වය නවතම අංශයන් ගණනාවක් ඔස්සේ පුළුල් විය. නමුත් එහි දී වුවද කාර්මික අංශය සඳහා ඉහළම දායකත්වයක් සපයනු ලැබුවේ රෙදිපිළි හා ඇඟළුම් අංශයයි. ඒ අනුව වර්තමානය වන විට ප්‍රමුඛම විදේශ විනිමය උපයන්නා වශයෙන් රෙදිපිළි සහ ඇඟළුම් කර්මාන්තය සම්ප්‍රදායික අපනයන කර්මාන්තයන් අභිබවා ඉදිරියට පැමිණ තිබේ. රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්තය කොතෙක් දුරට වර්ධනය වී ඇද්ද යන්න වර්ෂ 2000 න් පසු අවධිය තුළ ශ්‍රී ලංකාවේ අපනයන සංයුතිය පිරික්සීමෙන් අවබෝධ වේ.

*වගු අංකය 07*

වර්ෂ දෙදහසේ සහස්‍රය තුළ වූ අපනයන සංයුතිය

| කාණ්ඩය | එ. ජ. ඩොලර් දශලක්ෂ | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2000 | 2002 | 2004 | 2005 | 2007 | 2009 |
| **කෘෂිකාර්මික අපනයන** | **1005** | **938** | **1065** | **1154** | **1507** | **1690** |
| තේ | 700 | 660 | 739 | 810 | 1025 | 1185 |
| රබර් | 29 | 27 | 51 | 47 | 109 | 98 |
| පොල් | 121 | 84 | 113 | 113 | 141 | 166 |
| **කාර්මික අපනයන** | **4283** | **3631** | **4506** | **4948** | **5920** | **5305** |
| ආහාරල පානවර්ග, දුම්කොළ | 152 | 123 | 175 | 318 | 513 | 406 |
| රෙදිපිළි හා ඇඟළුම් | 2982 | 2424 | 2809 | 2895 | 3342 | 3274 |
| ඛණිජ නිෂ්පාදන | 98 | 73 | 100 | 131 | 168 | 134 |
| රබර් නිෂ්පාදන | 196 | 182 | 283 | 394 | 481 | 384 |
| පිගන් නිෂ්පාදන | 47 | 42 | 47 | 47 | 47 | 36 |
| සංචාරක භාණ්ඩ, සපත්තු | 176 | 84 | 43 | 44 | 23 | 136 |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 244 | 266 | 386 | 330 | 542 | 330 |
| දියමන්ති හා ස්වර්ණාභරණ | 192 | 205 | 265 | 278 | 368 | 329 |
| අනෙකුත් කාර්මික උපකරණ | 197 | 231 | 398 | 512 | 433 | 396 |
| **ඛණිජ අපනයන** | **97** | **90** | **120** | **143** | **129** | **88** |
| මැණික් | 93 | 86 | 109 | 120 | 106 | 69 |
| වෙනත් | 03 | 05 | 11 | 23 | | 20 |

*මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තා, 2000 2009.*

වර්තමානය වන විට කාර්මික අංශය සඳහා රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන හැරුණ විට ඉහළම අපනයන වටිනාකමක් ලබා දෙන්නේ යන්ත්‍ර සූත්‍ර හා උපකරණවලිනි. ඊට අමතරම රබර් නිෂ්පාදන අංශය මඟින් ද කාර්මික අපනයන. අංශය සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයා ඇත. කෙසේ නමුත් සමස්ත ආර්ථිකය සඳහා ඇඟළුම් කර්මාන්තය හැරුණ විට කාර්මික අංශය හරහා දායක වන වෙනත් විශේෂ නිෂ්පාදන අංශයක් දැකිය නොහැකි වේ. වර්ෂ 2005 දී කාර්මික අංශය සඳහා ආහාර, පානවර්ග හා දුම්කොළ, ඛණිජ නිෂ්පාදන, රබර් නිෂ්පාදන, පිගන් නිෂ්පාදන, සංචාරක භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර, දියමන්ති හා ස්වර්ණාභරණ යන නිෂ්පාදන අංශයන් පිළිවෙලින් ඇමරිකානු ඩොලර් මිලියන 318, 131, 394, 47, 44, 330 හා 278 ක් වශයෙන් දායක වී ඇත.

3. ප්‍රස්තාර සටහන

විදේශ වෙළඳාමේ ව්‍යුහාත්මක වෙනස්කම්

අපනයන 1948




අපනයන 2009




*මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තාව, 1950 සහ 2009*

වර්ෂ 1975 සිට 2005 දක්වා වූ කාල පරිච්ඡේදය පිළිබඳව සලකා බැලීමේ දී පැහැදිලි ලෙසම දැකිය හැකි කරුණක් වන්නේ අපනයන සංයුතිය වෙනස් වී ඇති ආකාරයයි. එනම් 1975 වර්ෂයේ අපනයන සඳහා කෘෂි අංශය කළ දායකත්වය අපනයනවල ප්‍රතිශතයක් ලෙස 82% ක් තරම් වූ අතර කාර්මික අංශයේ දායකත්වය වූයේ 13% ක් තරම් ප්‍රමාණයකි (ශ්‍රී ලංකා මහ බැංකුව, 1973ඃ68). මෙම ආංශික දායකත්වය 2009 වර්ෂය වන විට සම්පූර්ණයෙන්ම වෙනස් වී ඇත. එනම් අපනයන සඳහා කාර්මික අංශයේ දායකත්වය අපනයනවල ප්‍රතිශතයක් ලෙස 75 % ක් තරම් වූ මට්ටමක පවතින අතර කෘෂි අංශයෙන් කරන දායකත්වය 24 % ක් තරම් මට්ටමක පවතී (ශ්‍රී ලංකා මහ බැංකුව, 2004ඃ59).

*වගු අංකය 08*

නිදහස ලැබූ මුල් අවධිය තුළ ජාත්‍යන්තර වෙළඳාම

| වෙළඳපොළ | 1953 | | 1954 | | 1955 | |
|---|---|---|---|---|---|---|
| | අපනයන% | ආනයන% | අපනයන% | ආනයන% | අපනයන% | ආනයන% |
| එක්සත් රාජධානිය | 47.7 | 64.5 | 57.0 | 58.2 | 54.3 | 59.3 |
| ඇමරිකා එක්සත් ජන. | 13.3 | 4.3 | 11.0 | 4.7 | 14.4 | 6.9 |
| යුරෝපා සංගම් රටවල් | 12.0 | 9.6 | 8.5 | 11.8 | 11.4 | 12.9 |
| වෙනත් | 27.0 | 21.6 | 23.5 | 25.3 | 19.9 | 20.9 |
| එකතුව | 100 | 100 | 100 | 100 | 100 | 100 |

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තා, 19531955.

නිදහස ලැබූ මුල් කාල පරිච්ඡේදය තුළ ඇමරිකා එක්සත් ජනපදය සමඟ කළ වෙළඳාමෙහි ආනයන කොටස තුළ ප්‍රධාන වශයෙන්ම අන්තර්ගත වූයේ යන්ත්‍රෝපකරණ හා රථවාහන යන කාර්මික භාණ්ඩත්, සහල්, තිරිඟු පිටි සහ සීනි යන අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩත්, ඇඟළුම් නිෂ්පාදනත්, ඛණිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදනත්, කඩදාසි ආශ්‍රිත නිෂ්පාදනත් වේ. පනහ දශකයේ මුල් භාගය තුළ ඒ එක් එක් භාණ්ඩයන්හි ආනයන වටිනාකම් 8 වගුවෙන් පෙන්වා ඇත.

*වගු අංකය 09*

නිදහස ලැබූ මුල් කාල පරිච්ඡේදයේ ආනයන සංයුතිය

| ආනයන | වටිනාකම (රු. මිලියන) | | | | | මුළු අපයනනයන්ගේ % ලෙස | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1953 | 1954 | 1955 | 1956 | 1957 | 1953 | 1954 | 1955 | 1956 | 1957 |
| **ආහාර හා පාන වර්ග** | **796** | **664** | **625** | **703** | **736** | **49.5** | **47.5** | **42.8** | **43.2** | **40.8** |
| සහල් | 324 | 273 | 222 | 264 | 255 | 20.1 | 19.5 | 15.2 | 16.2 | 14.1 |
| තිරිඟු පිටි | 164 | 91 | 86 | 71 | 86 | 10.2 | 6.5 | 5.9 | 4.4 | 4.8 |
| සීනි | 71 | 63 | 63 | 96 | 82 | 4.4 | 4.5 | 4.3 | 5.9 | 4.5 |
| මාළු නිෂ්පාදන | 58 | 57 | 68 | 78 | 80 | 3.6 | 4.1 | 4.6 | 4.8 | 4.4 |
| ආහාර රසකාරක | 29 | 43 | 37 | 36 | 41 | 1.8 | 3.1 | 2.6 | 2.2 | 2.3 |
| **කාර්මික භාණ්ඩ** | **810** | **732** | **835** | **926** | **1068** | **50.3** | **52.4** | **57.2** | **56.8** | **59.2** |
| ඛණිජ තෙල් නිෂ්පාදන | 120 | 103 | 127 | 111 | 202 | 7.5 | 7.4 | 8.7 | 6.8 | 11.2 |
| පොහොර | 38 | 41 | 49 | 54 | 70 | 2.4 | 2.9 | 3.3 | 3.3 | 3.9 |
| සිමෙන්ති | 16 | 13 | 13 | 17 | 28 | 1.0 | 0.9 | 0.9 | 1.0 | 1.6 |
| වානේලයකඩ | 55 | 46 | 64 | 86 | 70 | 3.4 | 3.3 | 4.4 | 5.3 | 3.9 |
| යන්ත්‍රෝපකරණ | 68 | 46 | 59 | 65 | 81 | 4.2 | 3.3 | 4.0 | 4.0 | 4.5 |
| රෙදිපිළි | 137 | 124 | 130 | 156 | 147 | 8.5 | 8.9 | 8.9 | 9.6 | 8.1 |
| රසායන ද්‍රව්‍ය | 32 | 37 | 35 | 37 | 42 | 2.0 | 2.6 | 2.4 | 2.3 | 2.3 |
| කඩදාසි නිෂ්පාදන | 26 | 28 | 28 | 30 | 34 | 1.6 | 2.0 | 1.9 | 1.8 | 1.9 |
| රථ වාහන | 45 | 27 | 35 | 53 | 54 | 2.8 | 1.9 | 2.4 | 3.3 | 3.0 |
| වෙනත් | 2 | 1 | - | - | - | 0.1 | 0.1 | - | - | - |
| මුළු | **1608** | **1397** | **1460** | **1630** | **1804** | **100** | **100** | **100** | **100** | **100** |

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තාව, 1955.

නිදහස ලැබූ මුල් කාල පරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකාව කරන ලද ආනයන ප්‍රධාන කාණ්ඩ දෙකකට වර්ග කළ හැකිය. එනම් ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන ලෙසත්, අමු ද්‍රව්‍ය සහ කාර්මික භාණ්ඩ ලෙසත්ය. ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදන සම්බන්ධයෙන් සලකා බැලීමේ දී ඒ තුළ ඉහළම ආනයන වියදමක් දරා ඇත්තේ සහල් සහ තිරිඟු පිටි සඳහාය. කාර්මික භාණ්ඩ ආනයන සම්බන්ධයෙන් සලකා බැලීමේ දී ඒ තුළ ඉහළම ආනයන වටිනාකමක් ගෙන ඇත්තේ රෙදිපිළි ආනයන වියදම් සඳහාය. මේ අනුව මුළු ආනයන වටිනාකමින් 50% කට වඩා වැඩි වටිනාකමක් පෙන්නුම් කරන්නේ කර්මික ආනයනයන් සම්බන්ධයෙන් වන අතර සමස්ත ආනයන වියදම්වල ද දැකිය හැකි වූයේ ක්‍රමිකව වර්ධනය වීමේ උපනතියකි.

1970 දශකයේ දී ද ශ්‍රී ලංකාවේ ආනයන රටාව හඳුනා ගැනීමේ දී ආනයනය කළ භාණ්ඩ ප්‍රධාන වශයෙන් පාරිභෝජන භාණ්ඩ, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ වශයෙන් කාණ්ඩ තුනක් යටතේ වර්ග කර දැක්විය හැකිය. පාරිභෝජන භාණ්ඩ ආනයනයේ දී වැඩිම වියදමක් දරා ඇත්තේ සහල්, තිරිඟු පිටි සහ සීනි යන භාණ්ඩ සඳහාය. අන්තර් භාණ්ඩ ආනයනයේ දී ඉහළම වියදමක් දරා ඇත්තේ පොහොර ආනයන සඳහාය. එනම් 70 දශකයේ දී ප්‍රධාන වශයෙන් කෘෂි අංශය මුල් කරගත් ආවෘත ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ බැවින් කෘෂිකාර්මික අංශය සඳහා වූ පොහොර අවශ්‍යතාවය ඉහළ විය. ආයෝජන භාණ්ඩ ආනයනයේදී ඉහළම ආනයන පිරිවැය දරා ඇත්තේ ප්‍රවාහන සහ යන්ත්‍රෝපකරණ ආයෝජන සඳහාය. ඒ බව 9 වගුවට අනුව පැහැදිලි වේ.

වගු අංකය 10

1970 දශකයේ මුල් භාගයේ වූ ප්‍රධාන ආනයන භාණ්ඩ

| ආනයන භාණ්ඩ | 1970 | 1971 | 1972 | 1973 |
|---|---|---|---|---|
| | මුළු ආනයනවල ප්‍රතිශතයක් ලෙස | | | |
| **පාරිභෝජන භාණ්ඩ** | **56** | **58** | **54** | **55** |
| සහල් | 14 | 10 | 8 | 10 |
| තිරිඟු පිටි | 11 | 10 | 9 | 17 |
| සීනි | 7 | 12 | 12 | 12 |
| තිරිඟු පිටි | 2 | 2 | 3 | 3 |
| බිත්තර, මාළු සහ මස් | 3 | 4 | 4 | 2 |
| ධාන්‍ය වර්ග, ළූණු, මිරිස් | 6 | 5 | 7 | 2 |
| ඇඟළුම් | 5 | 5 | 2 | 2 |
| **අන්තර් භාණ්ඩ** | **20** | **20** | **22** | **28** |
| පොහොර | 4 | 3 | 3 | 4 |
| ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන | 3 | 1 | 2 | 11 |
| කඩදාසි | 2 | 2 | 2 | 2 |
| නූල් සහ කෙඳි | 2 | 2 | 3 | 1 |
| **ආයෝජන භාණ්ඩ** | **23** | **21** | **21** | **17** |
| සිමෙන්ති | 0.3 | 0.2 | 0.1 | 0.1 |
| ප්‍රවාහන උපකරණ | 5 | 4 | 5 | 4 |
| යන්ත්‍රෝපකරණ | 12 | 10 | 9 | 8 |

*මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තාව, 1970 1973.*

වර්ෂ 1977 දී විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දීමෙන් පසුව එළඹි 1980 දශකය තුළ දින් 1970 දශකයේ දී සිදු කරන ලද ආනයනයන්ම සිදු කරන ලදි. එහි දී ද ප්‍රධාන ආනයන කාණ්ඩ වන පාරිභෝජන භාණ්ඩල අන්තර් භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ ආනයනය කර තිබුණි. පාරිභෝජන භාණ්ඩ ආනයන අතර ප්‍රධාන වශයෙන් සහල් සහ තිරිඟු පිටි ප්‍රධාන විය.

1990 දශකයේ දීද පාරිභෝජන භාණ්ඩ, අන්තර් භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ ආනයනය කර ඇත. පාරිභෝජන භාණ්ඩ අතර වැඩි වශයෙන් අන්තර්ගත වුයේ සීනි ආනයනයයි. එය 1991 වර්ෂයේ දී සමස්ත ආනයනවලින් 4% ක් ද 1992 වර්ෂයේදී සමස්ත ආනයනවලින් 3% ක්ද 1993 වර්ෂයේ දී සමස්ත ආනයනවලින් 3% ක් ද ලෙස විය (ශ්‍රී ලංකා මහ බැංකුව, 1993ඃ97). අන්තර් භාණ්ඩ ආනයනයේ දී ඒ තුළ වැඩි වශයෙන් අන්තර්ගත වූයේ රෙදිපිළි සහ ඛණිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදනයි. 1993 වර්ෂයේදී රෙදිපිළි ආනයන වටිනාකම රුපියල් මිලියන 41740 ක් වූ අතර ඛනිජ තෙල් ආශ්‍රත නිෂ්පාදන ආනයන වටිනාකම රුපියල් මිලියන 14920 ක් විය. එනම් දේශීය ආර්ථිකයේ නිෂ්පාදන අංශය තුළ ඉහළම ක්‍රියාකාරිත්වයක් ඇති නිෂ්පාදන අංශය වන ඇඟළුම් කර්මාන්තය සඳහා අවශ්‍ය රෙදිපිළි ආනයනවලින් 50% කට වැඩි අවශ්‍යතාවක් සපුරා ඇත්තේ රෙදිපිළි ආනයන තුළිනි. එහිදී ශ්‍රී ලංකාව වැඩිවශයෙන් රෙදිපිළි ආනයනය කර ඇත්තේ චීනයනි.

වගු අංකය 11

1990 දශකයේදී ආනයන වියදම්
(සමස්ත ආනයන වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස)

| ආනයන භාණ්ඩ | 1991 | 1992 | 1993 |
|---|---|---|---|
| **පාරිභෝජන භාණ්ඩ** | **26** | **21** | **19** |
| සහල් | 1.3 | 1.9 | 1.2 |
| පිටි | 0 | 0 | 0.3 |
| සීනි | 4.1 | 3.2 | 2.9 |
| **අන්තර් භාණ්ඩ** | **50.7** | **53.8** | **53.7** |
| ඛණිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන | 10.2 | 9.1 | 7.7 |
| පොහොර | 1.9 | 1.5 | 1.6 |
| තිරිගු | 2.6 | 3.0 | 2.9 |
| රෙදිපිළි සහ ඇඟළුම් | 16.3 | 21.9 | 21.6 |
| **ආයෝජන භාණ්ඩ** | **23.5** | **24.2** | **26.1** |
| යන්ත්‍රෝපකරණ | 9.4 | 11.1 | 11.6 |
| ප්‍රවාහන උපකරණ | 6.0 | 5.1 | 7.8 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 5.4 | 5.2 | 4.8 |

මුලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තාව, 1993.

වර්ෂ 20042005 කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ ආනයන සංයුතිය නිදහස ලැබූ මුල් කාල පරිච්ඡේදයට සාපේක්ෂව සලකා බැලීමේ දී ඒ තුළ ආයෝජන භාණ්ඩ ආනයනයන්ද අන්තර්ගත වේ. නමුත් පාරිභෝජන භාණ්ඩ ආනයන සංයුතිය තුළ ගෙවුන දශක කිහිපයට සාපේක්ෂව විශේෂ වූ වෙනස්වීමක් දැකිය නොහැකි වේ. එනම් පසුගිය දශකයන්ගේ මෙන් සහල්, සීනී, පිටි යන භාණ්ඩයන් ආනයනය කර ඇති අතර එය සමස්ත ආනයන වටිනාකමින් සුළු ප්‍රතිශතයක් විය. අන්තර් භාණ්ඩ ආනයන සම්බන්ධයෙන් සලකා බැලීමේ දී එක්දහස් නවසිය අසූව අනූව දශකයන්ගේ මෙන් වර්තමාන කාල පරිච්ඡේදය තුළ දී ඛණිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන ආනයනයන් ඉහළ ගොස් ඇත. නමුත් 1970 දශයේදී පොහොර ආනයන් සඳහා ලැබී තිබුණ දායකත්වය 1980, 1990 දශකයේ මෙන් වර්ෂ 2004, 2005 කාල පරිච්ඡේදය තුළ දී අඩු වී ඇත. එසේම රෙදිපිළි සහ ඇඟළුම් ආනයනයන් අන්තර් භාණ්ඩ ආනයන තුළ ඉහළ දායකත්වයක් අත්කර ගෙන තිබුණි. එනම් එය සමස්ත ආනයන වටිනාකමින් 17% ක් විය. ආයෝජන භාණ්ඩ ආනයන සම්බන්ධයෙන් සලකා බැලීමේ දී 1980, 1990 දශකයන්ව, දී මෙන් වර්ෂ 20042005 කාල පරිච්ඡේදය සඳහා යන්ත්‍රෝපකරණ ආනයන වටිනාකම් ඉහළ දායකත්වයක් ලබාදී තිබුණි. එනම් 2004 වර්ෂයේදී එය සමස්ත ආනයන වටිනාකමින් 11% ක් ද, 2005 වර්ෂයේ දී එය සමස්ත ආනයන වටිනාකමින් 10% ක් ද විය.

**වගු අංකය 12**

මෑත කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ ආනයන සංයුතිය

| ආනයන භාණ්ඩ | 2004 | | 2005 | | 2009 | |
|---|---|---|---|---|---|---|
| | වටිනාකම (ඇ.ඩො.මි.)* | % | වටිනාකම (ඇ.ඩො.මි.)* | % | වටිනාකම (ඇ.ඩො.මි.)* | % |
| **පාරිභෝජන භාණ්ඩ** | **1624** | **20.3** | **1644** | **20.5** | **2560** | **18.2** |
| සහල් | 59 | 0.7 | 15.6 | 0.2 | 44.3 | 0.3 |
| සීනි | 111 | 1.4 | 132 | 1.5 | 206.4 | 1.5 |
| තිරිඟු | 183 | 2.3 | 141 | 1.6 | 375.5 | 2.7 |
| **අන්තර් භාණ්ඩ** | **4646** | **58.1** | **5317** | **60** | **8344** | **59.2** |
| ඛණිජ තෙල් | 1209 | 15.1 | 1655 | 18.7 | 3368 | 23.9 |
| පොහොර | 107 | 1.3 | 135 | 1.5 | 576.6 | 4.1 |
| රසායන ද්‍රව්‍ය | 210 | 2.6 | 249 | 2.8 | 361.4 | 2.6 |
| රෙදිපිළි හා ඇඟළුම් | 1514 | 18.9 | 1531 | 17.3 | 1702 | 12.1 |
| **ආයෝජන භාණ්ඩ** | **1670** | **20.9** | **1870** | **21.2** | **3047.9** | **21.6** |
| යන්ත්‍රෝපකරණ | 857 | 10.7 | 860 | 9.7 | 1330.7 | 9.4 |
| ගමනා ගමන උපකරණ | 257 | 3.2 | 325 | 3.7 | 438.8 | 3.1 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 402 | 5.0 | 507 | 5.7 | 942.6 | 6.7 |

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තාව, 2005,2009.

(ඇ.ඩො.මි.)* = ඇමරිකානු ඩොලර් මිලියන

2005 වර්ෂයේදී ඉහළ ඉල්ලුම සහ මිල ගණන් පිළිබිඹු කරමින් ආනයන 10% න් වර්ධනය විය. අධිප්‍රමාණය වූ විනිමය අනුපාතය, පොලී අනුපාතය පහළ මට්ටමක පැවතීම, ඉහළ ආර්ථික ක්‍රියාකාරිත්වය සහ සුනාමියට ලක්වූ ප්‍රදේශවල ප්‍රතිසංස්කරණ කටයුතු හේතුවෙන් අන්තර්, ආයෝජන සහ පාරිභෝගික භාණ්ඩ යන ප්‍රධාන කාණ්ඩ සඳහා වූ ආනයන ඉල්ලුම ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් ඛණිජ තෙල් නිෂ්පාදන සහ රෙදිපිළි නිෂ්පාදන ඇතුළත් වූ අන්තර් භාණ්ඩ ආනයනයන් 2005 වර්ෂයේදී 15% න් වර්ධනය විය. ඛණිජ තෙල් නිෂ්පාදන ආනයන වියදම් ඉහළ යාම සඳහා 2005 වර්ෂයේ දී ලෝක වෙළඳපොලේ 39.8% කින් ඉහළ ගිය බොරතෙල් මිල හේතු විය (ශ්‍රී ලංකා මහ බැංකුව,2005:106). 2004 වර්ෂයේදී 20% වූ පාරිභෝජන භාණ්ඩවල දායකත්වය 2005 වර්ෂයේදී 19% දක්වා අඩු විය. රටෙහි වර්ධනය වෙමින් තිබූ ආයෝජන හා නිෂ්පාදන ක්‍රියාකාරකම් හේතුවෙන් අන්තර් භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ පිළිවෙලින් 60% ක් සහ 21% ක් දක්වා වැඩි විය.

## 4. දළ දේශීය නිෂ්පාදනය තුළ සිංගප්පූරුවේ නිෂ්පාදන අංශය

සිංගප්පූරු ආර්ථිකය ව්‍යුහය ප්‍රධාන වශයෙන්ම කාර්මික හා සේවා අංශයන් විසින් මෙහෙයවනු ලබයි. එනම් මෙම අංශයන් දෙක ආර්ථිකයේ නායක අංශයන් වේ. රාජ්‍ය අංශය විසින් ඉහළ එකතු කළ වටිනාකමක් ඇති අංශයන් මගින් තරගකාරී වාසි ලබා ගැනීමේ අරමුණින් මෙම අංශයන් මෙහෙයවනු ලබයි. රජය විසින් විදේශ ආයෝජන සඳහා විද්‍යුත් හා සන්නිවේදන, විද්‍යුත් උත්පාදන, මූල්‍ය පහසුකම් සහ සිල්ලර යන අංශයන් කිහිපයක් විවෘත කර ඇත. එහි පිරිවැය අවමකරණය සඳහා බදු කපා හැරීම් සහ බදු කුලී අඩු කිරීම යනි නිර්ණායක යොදා ගෙන ඇත.

2008 වර්ෂයේ දී කාර්මික අංශය දළ ජාතික නිෂ්පාදනය සඳහා කළ දායකත්වය 24.6 % ක් සහ සේවා අංශය සඳහා කළ දායකත්වය 65.6% ක් විය. රසායනික සහ විද්‍යුත් නිෂ්පාදන අංශය, කාර්මික අංශය සඳහා ඉහළම දායකත්වයක් සපයයි. එනම් සමස්ත දේශීය නිෂ්පාදනයෙන් 37.8 % ක් රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන වන අතර 27.6% ක් විද්‍යුත් නිෂ්පාදන වේ. 2009 වර්ෂයේ දී කාර්මික අංශය දළ ජාතික නිෂ්පාදනය සඳහා 26.8% න් ද සේවා අංශය 73.2% න් ද දායක වී ඇත. සිංගප්පූරුවේ මුළු ශ්‍රම බලකාය වන මිලියන 3.03 න් 76.2 % ක් සේවා අංශයේ සේවා නියුක්ත වී ඇත. දළ දේශීය නිෂ්පාදිත වර්ධනය අනුපාතය 2009 වර්ෂයේ දී 17 කි.

සිංගප්පූරුවේ මූල්‍ය වෙළඳපොල මෙහෙයවන ප්‍රධාන දේශීය හා ජාත්‍යන්තර බැංකු වන්නේ Bank of Singpore Limited, United Oversease Bank limited, Far Eastern Bank, Bank of China, City Bank, Bank of Amarica, Jp Morgan chase Bank. 1999 වර්ෂයේ දී ආර්ථික වර්ධන වේගය 5.4% ක් ද 2000 වර්ෂයේ දී 9 % ක් ද 2004 වර්ෂයේ දී 8.3% ක් ද 2005 වර්ෂයේ දී 6.4% ක් ද 2006 වර්ෂයේ දී 7.9% ක් ද ලෙස ද වේ. මෙසේ ආර්ථික වර්ධනය වේගය පහත වැටීමට 2001 වර්ෂයේ දි ඇති වූ මූල්‍ය අර්බුදය හේතු විය. නමුත් ආර්ථික වර්ධන වේගය 5% කට වඩා ඉහළ මට්ටමක පවත්වා ගෙන යාමට හේතු වී ඇත්තේ විද්‍යුත් නිෂ්පාදනවලට ඇති ලෝක ඉල්ලුම ඉහළ යාමයි. මේ හරහා ඖෂධ, මූල්‍ය සේවය සහ කාර්මික අංශයේ ප්‍රගතිය ඉහළ ගියහ.

*වගු අංකය 13*

2009වර්ෂයේ දි ප්‍රධාන අපනයන හවුල් කරුවන්ගේ දායකත්වය

| අපනයන හවුල්කරුවන් | | ආනයන හවුල්කරුවන් | |
|---|---|---|---|
| අපනය රට | % දායකත්වය | ආනයන රට | % දායකත්වය |
| 1. හොංකොං | 11.6 | 1. ඇ. එ. ජනපදය | 14.7 |
| 2. මලයාසියාව | 11.5 | 2. මලයාසියාව | 11.6 |
| 3. ඇ. එ. ජනපදය | 11.2 | 3. චීනය | 10.5 |
| 4. ඉන්දුනීසියාව | 9.7 | 4. ජපානය | 7.6 |

මූලාශ්‍රය: http://en.wikipedia.org/wiki/Economy of singpore

සිංගප්පූරුවේ ප්‍රධාන අපනයන හවුල්කරු වන්නේ ඇමරිකා එක්සත් ජනපදයයි. 2008 වර්ෂයෙ දී ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය බටහිර යුරෝපයේ ප්‍රධාන රටවල් 4කට සමාන විය. සිංගප්පූරුව ප්‍රධාන ආදායම් උත්පාදන මාර්ගය වන්නේ **භාණ්ඩ අපනයනය** වේ. ඉහල අපනයන ආදායම් තුළින් ස්වභාවික සම්පත් හා අමුද්‍රව්‍ය යනාදිය මිල දී ගැනීමට හැකියාව ලැබුණි. තවද දියුණු වරාය යටිතල පහසුකම් සහ පුහුණු ශ්‍රම හමුදාවක් සිටීම භාණ්ඩ අපනයන ඉහළ යාම හා එමගින් ආර්ථික වර්ධන වේගය ඉහළ යාමට හේතු විය.

*වගු අංකය 14*

ප්‍රධාන ආනයනය සහ අපනයන

| අපනයන භාණ්ඩ | ආනයන භාණ්ඩ |
|---|---|
| 1. රසායනික ද්‍රව්‍ය | 1. බොර තෙල් සහ පෙට්‍රල් ආශ්‍රිත නිෂ්පාදන |
| 2. පෙට්‍රල් ආශ්‍රිත නිෂ්පාදන | 2. ගුවන් යාන |
| 3. රෙදිපිළි සහ ඇඟළුම් | 3. මෝටර් රථ රේඩියෝ සහ රූපවාහිනී අමතර කොටස් |
| 4. ආහාර සහ පානවර්ග | 4. රසායනික ද්‍රව්‍ය |
| 5. විද්‍යුත් සහ සන්නිවේදන | 5. ආහාර සහ පානවර්ග |
| 6.විද්‍යුත් සහ ප්‍රවාහන උපකරණ | 6. යකඩ සහ වානේ |
| | 7. රෙදි සහ නූල් |

මූලාශ්‍රය:http://en.wikipedia.org/wiki/Economy of singpore

## 5. දළ දේශීය නිෂ්පාදනය තුළ මලයාසියාවේ නිෂ්පාදන අංශය

මලයාසියාවේ ආර්ථික වර්ධනය සඳහා දායක වන ප්‍රධාන මූලාශ්‍රය වන්නේ අපනයන අංශයයි. එහි දී රජය ප්‍රමුඛතා දෙන ඉහළ එකතු කළ වටිනාකමක් ඇති දේශීය නිෂ්පාදන අංශයන් වන්නේ ඖෂධ, තාක්ෂණික කර්මාන්ත, වෛද්‍ය සේවා, විද්‍යුත් උපකරණ, රසායන ද්‍රව්‍ය නිෂ්පාදන, ආහාර සහ පාන වර්ග, යන්ත්‍රෝපකරණ සහ ඇඟළුම් යනා දී නිෂ්පාදන අංශයන් වේ. සමස්තයක් ලෙස මලයාසියාවේ දළ දේශීය නිෂ්පාදිත වර්ධන වේගය 7% ක් වේ. සේවා අංශය ආර්ථික වර්ධනය සඳහා විශාල දායකත්වයක් ලබා දෙයි.

*වගු අංකය 15*

දළ දේශීය නිෂ්පාදිත වර්ධන වේගය

| නිෂ්පාදන අංශයන් | 2008 | 2009 |
|---|---|---|
| කෘෂිකාර්මික | 9.7 | 10.1 |
| කර්මාන්ත | 44.6 | 42.3 |
| සේවා | 45.7 | 47.6 |

*මූලාශ්‍රය:http://www.economywatch.com/economy growth/malysia*

### 5. 1 ප්‍රාථමික අංශය

මලයාසියාවේ කෘෂිකර්මාන්තය සඳහා හිතකර ස්වභාවික සම්පත් සමුදායක් පවතී. එය එරට ආර්ථික වර්ධනය සඳහා ඉවහල් වී ඇත. කොකෝවා, වී, පාම් තෙල්, දැව, ගම්මිරිස් සහ රබර් යන කෘෂි නිෂ්පාදන විදේශ විනිමය උපයන ප්‍රධාන මාර්ගයන් බවට පත් වී ඇත. ඊට අමතරව පොල්, එළවළු, කෝපි, තේ, දුම්කොළ ආදී කෘෂි භාණ්ඩයන් ද නිෂ්පාදනය කරයි. 1960 දශකයේ ආරම්භ කරන ලද වන සංරක්ෂණ ව්‍යාපෘති ඉතා ඉහළ මට්ටමකින් ක්‍රියාත්මක කළ බැවින් දැව ආශ්‍රිත නිෂ්පාදනයන්ගේ ආදායම් මාර්ග ඉහළ ගියහ.

### 5.2 ද්විතීක අංශය

දළ දේශීය නිෂ්පාදනයෙන් 30% ක දායකත්වයක් කාර්මික අංශය විසින් සපයයි. 1999 1970 කාල පරිච්ඡේදය තුළ එහි දායකත්වය 13. 9% ක් විය. සවභාවික සම්පත් බහුල බැවින් කාර්මික අංශයේ ප්‍රගතිය සඳහා ඉවහල් කර ගත හැකි ඛනිජ වැලි, ස්වභාවික ගෑස්, පෙට්‍රල් ආදිය හරහා විද්‍යුත් උපාංග නිෂ්පාදනය වැඩි කිරීමටත් එමගින් අපනයන ආදායම් ඉහළ යාමටත් සැලකිය යුතු දායකත්වයක් ලබා දී තිබුණි. දැව ආශ්‍රිත නිෂ්පාදන, රෙදිපිළි සහ ඇඟළුම්, විදුලි උපකරණ සහ පෙට්‍රල් නිෂ්පාදන ප්‍රධාන කර්මාන්ත අංශයන් වේ.

වගු අංකය 16

ආනයන සහ අපනයනය හවුල්කරුවන් 2008

| අපනයන හවුල්කරුවන් | % දායකතවය | ආනයන හවුලකරුවන් | %දායකත්වය |
|---|---|---|---|
| සිංගප්පූරුව | 13.9 | සිංගප්පූරුව | 11.1 |
| චීනය | 12.2 | චීනය | 13.9 |
| ඇ. එ. ජ. | 10.9 | ඇ. එ. ජ. | 11.2 |
| ජපානය | 9.8 | ජපානය | 12.5 |
| තායිලන්තය | 5.4 | තායිලන්තය | 6.0 |
| හොංකොං | 5.2 | ඉන්දුනීසියාව | 5.3 |
| | | දකුණු කොරියාව | 4.6 |
| | | ජර්මනිය | 4.2 |
| | | තායිවානය | 4.2 |

මූලාශ්‍රය:http://www.economywatch.com/economy

## 6. දළ දේශීය නිෂ්පාදනය තුළ තායිවානයේ නිෂ්පාදන අංශය

තායිවානයේ ආර්ථිකය ප්‍රධාන වශයෙන් සංචාරක කර්මාන්තය සහ ඒ හා බැඳුනු කටයුතු මත රදා පවතී. 70% ට වඩා වැඩි දායකත්වයක් සංචාරක කර්මාන්තය මගින් ආර්ථිකය වෙත සපයයි. පසුගිය දශක තුන පුරාවටම දළ දේශීය නිෂ්පාදිතයෙන් 71.1% ක දායකත්වයක් සේවා අංශය මගින් සපයයි. කර්මාන්ත අංශය 27.5% ක දායකත්වයක් ද, කෘෂි අංශය 1.4% ක දායකත්වයක් ද දළ දේශීය නිෂ්පාදිතය සඳහා සපයයි. මේ අනුව සේවා අංශය ආර්ථිකය සඳහා දැඩි දායකත්වයක් සපයන අතර ඉහළ තාක්‍ෂණික ක්‍රමවේදයන් භාවිත කරයි. තායිවානයේ ආර්ථික වර්ධන වේගය 8% ක මට්ටමක පවතී. ඉහළ ආර්ථික වර්ධන වේගයක් පවත්වාගෙන යාම සඳහා ජාත්‍යන්තර වෙළඳාම දායක වේ.

*වගු අංකය 17*

ආනයන සහ අපනයන හවුල්කරුවන් 2007

| අපනයන හවුල්කරුවන් | කර්මාන්ත % | කෘෂි % | ආනයන හවුලකරුවන් | කාර්මික % |
|---|---|---|---|---|
| ජපානය | 6.4 | 12.1 | ජපානය | 22 |
| ඇ. එ. ජ. | 12.9 | 13 | | |
| චීනය | 32.4 | 10.9 | | |
| හොංකොං | 8.5 | | | |
| දකුනු කොරියාව | | 7.3 | | |

මූලාශ්‍රය:http://www.economywatch.com/economy

*ශ්‍රී ලංකාවේ නිෂ්පාදන අංශ*

## නිගමන

ඉංග්‍රීසීන් විසින් 1815 දී කන්ද උඩරට රාජධානිය යටත්කර ගන්නා තෙක්ම දළ දේශීය නිෂ්පාදිතයට ඉහළම දායකත්වයක සැපයූ නිෂ්පාදන අංශය ලෙස, වී නිෂ්පාදනය ප්‍රමුඛ වූ දේශීය කෘෂි අංශය හඳුන්වා දිය හැකිය. නමුත් ඉංග්‍රීසීන් විසින් කන්ද උඩරට රාජ්‍යධානිය යටත් කර ගැනීමෙන් පසු දේශීය කෘෂි අංශයට ලැබී තිබුණ දායකත්වය ක්‍රමයෙන් ගිලිහී ගොස් තේ, රබර්, පොල් මත පදනම් වූ වාණිජ බෝග වගාවක් දක්වා නිෂ්පාදන අංශය විතැන් විය. එනම්, මෙම කාල පරිච්ඡේදය තුළ දී අපනයන කෘෂි අංශය මගින් දළ දේශීය නිෂ්පාදිතයෙන් 70% කට දායක වී ඇත. 1950 දශකයෙන් පසු ක්‍රියාත්මක කළ රාජ්‍ය ප්‍රතිපත්ති මඟින් කාර්මික අංශයේ වර්ධනය සඳහා ප්‍රතිපත්ති සැකසී තිබුණි. ඒ අනුව කෘෂි අංශය මගින් දළ දේශීය නිෂ්පාදිතයට කළ දායකත්වය අභිබවා යාමට කාර්මික අංශයට හැකියාව තිබුණි. එනම්, 1970 දශකයේ සිට 2000 සහශ්‍රය දක්වා කෘෂි අංශය මගින් දළ දේශීය නිෂ්පාදිතයට කළ දායකත්වය ක්‍රමයෙන් අඩු වී ඇති අතර කාර්මික අංශය මඟින් කළ දායකත්වය ක්‍රමයෙන් වැඩි වී ඇත. නිදහසින් පසු කාලපරිච්ඡේදයේ පටන් කාර්මික අංශය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ රාජ්‍ය ප්‍රතිපත්ති, එහි ප්‍රගමනය සඳහා දායක වී ඇති බවට නිගමනය කළ හැකිය. එනම් 1948, 1958, 1961, 1966 සහ 1972 යන වර්ෂවලදී ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය ප්‍රතිපත්ති, කාර්මික අංශයේ දියුණුව සඳහා මඟ පෑදුණි. ඊට අමතරව 1977 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ද කාර්මික අංශයේ ප්‍රවර්ධනය සඳහා හේතු විය. ඒ අනුව 2009 වර්ෂයේ දී කාර්මික අංශයේ දායකත්වය අපනයනවල ප්‍රතිශතයක් ලෙස 75% ක් ලෙස පැවති අතර කෘෂි අංශයේ දායකත්වය 24% ක ලෙස පැවතිණි. 1986 වර්ෂය වන විට රෙදිපිළි සහ ඇඟළුම් කර්මාන්තය, කාර්මික අංශය සඳහා ඉහළම දායකත්වය සපයන අංශය බවට පත් වී සිය දායකත්වය දිගටම පවත්වා ගත්තේය. වර්තමානය වන විට දළ දේශීය නිෂ්පාදනය සඳහා ඉහළම දායකත්වය සපයන අංශය බවට පත්ව ඇත්තේ සේවා අංශයය. ඒ අතර තොග සහ සිල්ලර වෙළඳ අංශය ඉහළ දායකත්වයක් ලබා දෙයි. ඒ තුළ අපනයන වෙළඳාම නිරූපනය කරනුයේ පහළ දායකත්යකි. එනම් එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 4% ක් තරම් වේ. නමුත් සිංගප්පූරුව, මලයාසියාව තායිවානය යන රටවල නිෂ්පාදන අංශයන්ගේ දායකත්වයක් අධ්‍යයනය කිරීමේ දී ආර්ථික වර්ධනය සඳහා ඉහළම දායකත්වයක් සපයන නායක අංශය බවට පත්තේ අපනයන අංශයයි. තායිවානයේ ආර්ථික වර්ධනය සඳහා ඉහළ දායකත්වයක් සපයන අංශය බවට සේවා අංශය බවට පත්ව ඇති අතර ඒ සඳහා සංචාරක කර්මාන්තය ඉහළ දායකත්වයක් සපයයි. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට තායිලන්තයේ සංචාරක කටයුතුවල නියැලීමට අවකාශය ඇති අතර සංචාරක කර්මාන්තය සඳහා වන යටිතල පහසුකම් ප්‍රමාණවත් තලයක පවතී. නමුත් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය දළ දේශීය නිෂ්පාදනය සඳහා 1% කට වඩා අඩු දායකත්වයක් සපයයි. නමුත් සංචාරක කර්මානත්ය ආර්ථික වර්ධනය සඳහා දායක කර ගත හැකි ඉහළ විභවතාවක් සහිත සේවා අංශයකි. මන්ද සංචාරක ආකර්ණය සඳහා ඉවහල් කර ගත හැකි ජෛව විවිධත්වයක් සහිත පෞරානිකත්වයෙන් හෙබි ලෝකයේ අග්‍රගන්‍ය රටක් වන්නේ ශ්‍රී ලංකාවය. එමෙන්ම මෙකී රටවල්හි කාර්මික අංශයේ ප්‍රවර්ධනය අපනයන අංශයේ වර්ධනය සඳහා සෘජු දායකත්වයක් සපයයි. විද්‍යුත් උපකර්ණ නිෂ්පාදනය සහ අපනයනය ඒ තුළ ප්‍රබල

භූමිකාවක් නිරූපනය කරයි. ශ්‍රී ලංකා ආර්ථිකයේද කාර්මික අංශය දළ දේශීය නිෂ්පාදනය සඳහා සාපේක්ෂව ඉහළ දායකත්වයක් ලබා දුන්නද ඒ තුළ ඇත්තේ රෙදි පිළි සහ ඇඟළුම් අපනයනයන්ය. ශ්‍රී ලංකාවේ රෙදිපිළි සහ ඇඟළුම් අපනයනය අංශයේ එකතු කළ වටිනාකම පහළ මට්ටමක ඇති බැවින් එමගින් ආර්ථික වර්ධනය සඳහා ඉවහල් කර ගත හැකි දායකත්වය පහළ මට්ටමක පවතී. නව කාර්මික රටවල මෙන් ශ්‍රී ලංකාවේ ද කාර්මික සහ සේවා අංශයන් දළ දේශීය නිෂ්පාදිතය සඳහා ඉහළ දායකත්වයක් සපයන අංශයන් නොවේ. සේවා අංශය දළ දේශීය නිෂ්පාදනය සඳහා ඉහළ දායකත්වයක් ලබා දුන්නද එහි වර්ධනය සෘණ වේ. එමෙන්ම එකී ක්ෂෙත්‍රයන් සඳහා නායකත්වය සපයන අනු අංශයන් තරගකාරී වාසි ලබා ගත හැකි ආකාරයේ හෝ ඉහළ එකතු කළ වටිනාකමක් සහිත හෝ දේශීය වශයෙන් විශේෂීකරණය කළ හැකි හෝ නිෂ්පාදන අංශයන් නොවේ. එබැවින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්වීම, ආර්ථික වර්ධය මූලික කරගනිමින් ප්‍රමාණවත් මට්ටමකට පැමිණ නැත.

## යෝජනා

1950 දශකයෙන් පසු කාල පරිච්ඡේදය තුළ කාර්මික අංශයේ ප්‍රවර්ධනය අරමුණු කරගනිමින් ක්‍රියාත්මක කළ රාජ්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් දළ දේශීය නිෂ්පාදිතයට කාර්මික අංශය කළ දායකත්වය ඉහළ ගොස් ඇත. එනමුත් තවදුරටත් කාර්මික අංශය ශක්තිමත් වන ආකාරයට කාර්මික ප්‍රතිපත්ති සැකසිය යුතුය. එනම් විදේශීය සෘජු ආයෝජන ලබා ගැනිමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, අමුද්‍රව්‍ය ආනයනය පහසු කිරීම, දේශීය කර්මාන්තය මත සඵල ආරක්ෂණයක් ඇති කිරීම, දේශීය මූල්‍ය අංශය තුළින් මූල්‍ය පහසුකම් ලබා ගැනිමට හැකි හා මූල්‍ය ක්ෂෙත්‍රය ස්ථායීව තබා ගත හැකි ආකාරයේ ප්‍රතිපත්තීන් සැකසීම කළ යුතුය. ක්‍රියාත්මක කළ කාර්මික ප්‍රතිපත්තීන් තුළ ඉහළම වර්ධනයක් සහ ඉහළම දායකත්වයක් සපයන නිෂ්පාදන අංශය බවට පත්ව ඇත්තේ ඇඟළුම් කර්මාන්තයයි. එබැවින් එය අරමුණු කරගනිමින් සියළු රාජ්‍ය අනුග්‍රහයන් සංකේන්ද්‍රණය විය යුතු අතර එහි එකතු කළ වටිනාකම ඉහළ දැමීමට ද කටයුතු සම්පාදනය විය යුතුය. එසේම ජාත්‍යන්තර වෙළඳපොළ අභිමුඛ කරගනිමින් විශේෂීකරණය කළ හැකි ආකාරයෙන් අනෙකුත් කාර්මික අංශයන් පිළිබඳවද අවධානය යොමු විය යුතුය. තවද සේවා අංශය සඳහා සංචාරක කර්මාන්තයෙන් ප්‍රබල දායකත්වයක් ලබා ගැනීමටද හැකිය. එනම් කිලෝමීටර් 650 ක් තරම් ඉතා කොටි දුර ප්‍රමාණයක තුළ ජෛව විවිධත්වයේ විශාල හාස්කමක් භුක්ති විඳිය හැකි අතර ඒ සඳහා කොළඹ, නුවර, මාතලේ යාකරමින් යාපනය දක්වා අධිවේගී මාර්ගයක් ස්ථාපිත කළ හැකිය. එමෙන් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කරුවන්ට ද සංචාරක කර්මාන්තය තුළ ආයෝජන කටයුතු කර ගෙන යාමට අවශ්‍ය පසුබිම ගොඩ නැගිය යුතුය.

### *අපනයන වෙළඳ දිශාව*

## නිගමන

ශ්‍රී ලංකාවේ අපනයන වෙළඳ දිශාව පිළිබඳව නිදහස ලද මුල් කාල පරිච්ඡේදයේ සිට සලකා බැලීමේ දී වර්තමානය වන විට සැලකිය යුතු වෙනසක් සිදු වී නොමැති බවට නිගමනය කළ හැකිය. එනම් ඇමරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය, එක්සත් රාජධානිය වැනි රටවල්, ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපයනය වෙළඳපොළ බවට පත් වී ඇත. සිංගප්පූරුව, මලයාසියාව, තායිවානය යන රටවල ආනයන අපනයන හවුල් කරුවන් ලෙස වැඩි වශයෙන් කටයුතු

කරන්නේ අග්නිදිග ආසියානු රටවල් වන තම කලාපීය රටවල් වන අතර ඇමරිකා එක්සත් ජනපදය ද ප්‍රධාන වෙළඳ හවුල් කරුවකු ලෙස කටයුතු කරයි.

## යෝජනා

අතීතයේ පටන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළඳපොළ වූ ඇමරිකා එක්සත් ජනපදය. එක්සත් රාජ්‍යධානිය සහ යුරෝපා සංගමයේ රටවලට අමතරව ලෝකයේ අනෙකුත් රටවලට ද අපනයන සංකේන්ද්‍රණය කළ යුතුය. එහි දී තම කලාපීය රටවල් මූලික විය යුතු අතර ඒ තුළින් කලාපීය සහයෝගිතාවය වර්ධනය කර ගත හැකි අතරම කලාපීය වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් තම නිෂ්පාදන අංශයන් ද ප්‍රවර්ධනය කළ හැකි වේ.

## *ශ්‍රී ලංකාවේ ආනයන*

## නිගමන

ජාත්‍යන්තර වෙළඳාමේ දී යම් රටකට සාපේක්ෂ වාසි සහිත භාණ්ඩ මොනවාද යන්න හඳුනා ගැනීම වැදගත් වනවා මෙන්ම සාපේක්ෂ අවාසි සහිත භාණ්ඩ මොනවාද යන්න හඳුනා ගැනීමද ඉතා වැදගත් වේ. ඒ අනුව රටක් ජාත්‍යන්තර වෙළඳාමේ දී ආනයනය කරනුයේ එරටෙහි දේශීය නිෂ්පාදනයේ දී සාපේක්ෂ ලෙස අවාසි සහගත භාණ්ඩයන්ය. එබැවින් ශ්‍රී ලංකාවේ ආනයනවල ස්වාභාවය පිළිබඳව නිගමනය කිරීමේ දී පෙනෙන්නේ ශ්‍රී ලංකාව නිදහස ලද මුල් කාල පරිච්ඡේදය තුළ දී ප්‍රධාන ලෙස ආනයනය කර ඇත්තේ අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ බවයි. මේ තුළ වැඩිම වියදමක් දරා ඇත්තේ සහල්, තිරිඟු පිටි සහ සීනි ආනයන සඳහාය. මේ තත්ත්වය 1970 දශකයේ අවසාන කාල පරිච්ඡේදය දක්වාම පැවතිණි. 1980 දශකය වන විට ශ්‍රී ලංකාව වැඩිම ආනයන වියදමක් දරා ඇත්තේ අන්තර් භාණ්ඩ ආනයනය සඳහාය. ඒ තුළ ඉහළම වියදම වාර්තා වන්නේ ඛණිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන සඳහාය. නමුත් 1970 දශකයේ දී අන්තර් භාණ්ඩ තුළ ඉහළම වටිනාකම වාර්තා වන්නේ පොහොර ආනයනය සඳහා වේ. 1990 දශකය වන විට වැඩිම ආනයන වියදමක්, අන්තර් භාණ්ඩ සඳහා දරා ඇති මුත් ඒ සඳහා වැඩිම දායකත්වයක් සපයා ඇත්තේ රෙදිපිළි සහ ඇඟළුම් ආනයනයන්ය. මේ තත්ත්වය 2009 කාල පරිච්ඡේදය දක්වාම වර්ධනය වෙමින් පැමිණ ඇත. මේ අනුව ශ්‍රී ලංකාව ආනයනය කරන්නේ සාපේක්ෂ ලෙස අවාසි සහිත භාණ්ඩ පමණක් නොවන බවට තහවුරු වේ. සමස්තයක් ලෙස ශ්‍රී ලංකාව පාරිභෝජන, අන්තර් සහ ආයෝජන භාණ්ඩයන් ඔස්සේ ආනයන සිදු කර ඇති බවට නිගමනය කළ හැක. නමුත් නිදහස ලද මුල් කාල පරිච්ඡේදය තුළ දී පාරිභෝජන භාණ්ඩ ආනයනය ඉහළ අගයක් ගත්ත ද, 1980 දශකයෙන් පසු වැඩිම ආනයන වියදමක් වාර්තා කර ඇත්තේ අන්තර් භාණ්ඩ ආනයන සඳහා වේ. නමුත් නව කාර්මික රටවල් තුළ ආනයන වෙළඳාම දී ප්‍රබල දායකත්වයක් සපයන භාණ්ඩයන් වන්නේ ආයෝජන භාණ්ඩයන්ය.

## යෝජනා

වර්තමානය වන විට ශ්‍රී ලංකාව තම ආනයන අඩු වැඩි වශයෙන් අන්තර්, ආයෝජන හා පාරිභෝජන යන භාණ්ඩ ත්‍රිත්ව කාණ්ඩය ඔස්සේම සිදු කර ගනී. ආනයනයන්හි දී යම් රටක් සතු විදේශ විනිමය තත්ත්වය පිරිහෙන අතර ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සලකා බැලීමේ දී එය

ප්‍රබල කාරණයක් වේ. මන්ද විදේශ විනිමයන්ට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල විශාල ලෙස අවප්‍රමාණය වී පැවතීමයි. මේ හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආනයන ප්‍රධාන ලෙසම කේන්ද්‍ර විය යුත්තේ අන්තර් හෝ ආයෝජන හෝ පාරිභෝජන හෝ වේවා සාපේක්ෂ ලෙස අවාසි සහගත සීමිත භාණ්ඩ ප්‍රමාණයක් සඳහාය. මන්ද වර්තමානය වන විට ශ්‍රී ලංකාව සහල්, සීනි, පරිප්පු, මුං ඇට, තිරිඟු පිටි, කරවල, අර්තාපල් වැනි පාරිභෝගික භාණ්ඩ ද ආනයනය කර ගනී. නමුත් සහල්, මුං ඇට, අර්තාපල්, සීනි වැනි භාණ්ඩ දේශීය ලෙස නිෂ්පාදනය කර ගැනීමේ විභවතාවයක් ඇති බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කළ යුතුය. එසේම දේශීය කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍යක් වන පොහොර නිෂ්පාදනයන් දේශීය ලෙස නිෂ්පාදනය කර ගැනීමේ විභවතාවක් ඇති හෙයින් එහි ආනයනයන් ද සීමා කොට එය දේශීය ලෙස නිෂ්පාදනය කර ගැනීමට කටයුතු කළ යුතුය. ඊට අමතරව රෙදිපිළි හා ඇඟළුම් ආනයනයන් ද සැලකිය යුතු මට්ටමක පවතී. එහි දී නිමි ඇඳුම් ආනයන සීමා කළ යුතු අතර ඒ සඳහා ඉහළ අගයක තීරු බද්දක් පැනවිය යුතුය. ඒ තුළින් දේශීය ඇඟළුම් කර්මාන්තය සඳහා සවිල ආරක්ෂණයක් ඇති වේ. නමුත් රෙදිපිළි, ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තය සඳහා යොදා ගනු ලබන ප්‍රධාන අමු ද්‍රව්‍යක් වන බැවින් ඒ සඳහා වන තීරුබදු ඉවත් කළ යුතු අතරම දේශිය ලෙස රෙදිපිළි නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා අදාල කටයුතු රාජ්‍ය මැදිහත් වීමෙන් සංවිධානය කළ යුතු අතර අයෝජන භාණ්ඩ ආනයනය සඳහා පෙළඹි විය යුතුය.

*ආනයන වෙළඳ දිශාව*

## නිගමන

ශ්‍රී ලංකාවේ ආනයන වෙළඳ දිශාව පිළිබඳව සලකා බැලීමේ දී නිදහස ලැබුණ මුල් අවධිය තුළ දී වැඩි වශයෙන් භාණ්ඩ ආනයනය කර ඇත්තේ ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය සහ යුරෝපා සංගම් රටවලිනි. නමුත් 1970 දශකයේ දී වැඩි වශයෙන් භාණ්ඩ ආනයන කර ඇත්තේ බල්ගේරියාව, හංගේරියාව, පෝලන්තය, රුමේනියාව, යුගොස්ලෝවියාව වැනි නැගෙනහිර යුරෝපා රටවලිනි. වර්තමානයේ දී ශ්‍රී ලංකාව මෙකී රටවල් සියල්ලෙන්ම භාණ්ඩ ආනයනය කර ගනී. එනම් හොංකොං (7%), චීනය (7%), තායිවානය (3%), දකුණු කොරියාව (2%), ඉන්දියාව (21%), ඇ.එ.ජ. (2%), මැදපෙරදිග (11%), යුරෝපා සංගමය (14%) යන රටවල් ඒ අතර ප්‍රධාන වේ.

## යෝජනා

වර්තමානය වන විට ශ්‍රී ලංකාව ධනවාදී කඳවුරේ පැවති රටවලින් මෙන්ම සමාජවාදී කඳවුරේ පැවති රටවලින් ද භාණ්ඩ ආනයනය කර ගනී. එනම් භාණ්ඩ ආනයනයේ දී සලකා බැලිය යුත්තේ ජාත්‍යන්තර වෙළඳපොළේ මිල අඩු, ඉහළ ගුණාත්මක භාවයක් සහිත භාණ්ඩයන් මිල දී ගැනීමටය. එබැවින් පවතින තත්ත්වය ඉතා හොඳ ප්‍රවණතාවක් ලෙස හඳුන්වා දිය හැකිය. නමුත් වර්තමානයේ ලෝකයේ බොහෝමයක් රටවල් විවිධ වූ ආර්ථික ඒකාබද්ධ වීම්වල (Economic Intergration) කටයුතු කරයි. ශ්‍රී ලංකාව ද එවැනිම වූ ආර්ථික ඒකාබද්ධ වීමක්

සහිත සන්ධා (SAFTA – Sauth Asian Free Trade Area ) කලාපයේ රටකි. මේ තුළ වෙළඳාම නිර්මාණය වීම (Trade Creation ) මෙන්ම වෙළඳාම පලවාහැරීම ද (Trade divetion) සිදු වේ. එබැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරමින් කලාපීය රටවලින් භාණ්ඩ ආනයනය කර ගැනිමට කටයුතු කළ යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ


තන්තිරිගම, පී. එම්. එස්. (1992) සංවර්ධන ආර්ථික විද්‍යාව, දෙවන සංස්කරණය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, කොළඹ.

කැලේගම, සමන් (1993), "යුරෝපීය ප්‍රජාව සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල් සමඟ වෙළඳාම කෙරෙහි එහි බලපෑම (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ සදහන් කිරීමක් සහිතව"(ලිපිය) 6 10 පිටු, "ආර්ථික විමසුම" වෙළුම 18, අංක 10, මහජන බැංකුව, කොළඹ.

ශ්‍රී ලංකා මහ බැංකුව (1983), වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

ශ්‍රී ලංකා මහ බැංකුව (1985), වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

ශ්‍රී ලංකා මහ බැංකුව (1986), වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

ශ්‍රී ලංකා මහ බැංකුව (1988), වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

ශ්‍රී ලංකා මහ බැංකුව (1991), වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

ශ්‍රී ලංකා මහ බැංකුව (1992), වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

ශ්‍රී ලංකා මහ බැංකුව (1993), වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

ශ්‍රී ලංකා මහ බැංකුව (1994), වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

ශ්‍රී ලංකා මහ බැංකුව (1995), වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

ශ්‍රී ලංකා මහ බැංකුව (1996), වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

ශ්‍රී ලංකා මහ බැංකුව (1999), වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

ශ්‍රී ලංකා මහ බැංකුව (2000), වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

ශ්‍රී ලංකා මහ බැංකුව (2004), වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

ශ්‍රී ලංකා මහ බැංකුව (2005), වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

ශ්‍රී ලංකා මහ බැංකුව (1998), වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

ශ්‍රී ලංකා මහ බැංකුව (2009), වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

Athkorala, R.(2007) "Exports cross & 6.8 billion in 2006"(Article)Pp4, "*Daily News*", Tuesday, March, 27.

Central Bank of Sri Lanka (1950), Annual Report. Central Bank of Sri Lanka, Colombo.

Central Bank of Sri Lanka (1951), Annual Report, Central Bank of Sri Lanka, Colombo.

Central Bank of Sri Lanka (1952), Annual Report, Central Bank of Sri Lanka, Colombo.

Central Bank of Sri Lanka (1953), Annual Report, Central Bank of Sri Lanka, Colombo.

Central Bank of Sri Lanka (1955), Annual Report, Central Bank of Sri Lanka, Colombo.

Central Bank of Sri Lanka (1959), Annual Report. Central Bank of Sri Lanka, Colombo.